# මාසික වෙළඳ විවරණිකාව


ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව


2023 නොවැම්බර්
05 වෙළුම 11 නිකුතුව

## විශේෂ සිදුවීම්

### මාසික අපනයන ක්‍රියාකාරිත්වය





### මාසික ආනයන ක්‍රියාකාරිත්වය





2023 වසරේ නොවැම්බර් මාසය තුළ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 999ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 0.4කින් ඉහළ ගියේය.

2023 වසරේ නොවැම්බර් මාසය තුළ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,389ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 3.9කින් පහළ ගියේය.

### අපනයන හා ආනයන වර්ධන අනුපාත (%)




### වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)





2023 වසරේ නොවැම්බර් මාසයෙන් අවසාන වන මාස එකොළහ තුළ දී පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව අපනයන ආදායම සියයට 9.4කින් පහළ ගියේය. එසේම, සලකා බලන කාලපරිච්ඡේදය තුළ ආනයන වියදම ද සියයට 9.1කින් පහළ යෑමක් වාර්තා විය.

වෙළඳ ගිණුමේ හිඟය, 2022 වසරේ නොවැම්බර් මාසයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 449ට සාපේක්ෂව 2023 වසරේ නොවැම්බර් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 390ක් දක්වා අඩුවිය.


## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - (2023 ජන. - නොවැ.)

### අපනයන (එ.ජ. ඩොලර් මිලියන) / ආනයන (එ.ජ. ඩොලර් මිලියන)




## අපනයන ක්‍රියාකාරිත්වය

### අපනයන ක්‍රියාකාරිත්වය - (ජන. - නොවැ.)




### අපනයන පරිමා හා මිල දර්ශක - (ජන. - නොවැ.)





2023 වසරේ නොවැම්බර් මාසයෙන් අවසාන වන මාස එකොළහ තුළ දී අපනයන ආදායම පහළ ගියේය. මේ සඳහා මූලික වශයෙන් කාර්මික සහ කෘෂිකාර්මික අපනයන ආදායම පහළ යෑම හේතු විය. ඊට ප්‍රතිවිරුද්ධ ලෙස, සලකා බලන කාලපරිච්ඡේදය තුළ ඛනිජමය නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ ගියේය.


2023 වසරේ නොවැම්බර් මාසයෙන් අවසාන වන මාස එකොළහ තුළ දී, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව අපනයන පරිමා දර්ශකය සියයට 2.3කින් ඉහළ ගිය අතර, අපනයන මිල දර්ශකය සියයට 11.4ක පහළ යෑමක් වාර්තා කළේය.

## කෘෂිකාර්මික අපනයන


### කෘෂිකාර්මික අපනයන ආදායම





### කෘෂිකාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන. - නොවැ.)




### තේ සහ රබර් මිල ගණන් *





*2022 වසරේ ජූලි මාසයේ දී රබර් (දුම් ගැසූ දාර රබර්) සඳහා වෙන්දේසියේ දී මිල ගණන් නියම වී නොමැත


2023 වසරේ නොවැම්බර් මාසයෙන් අවසාන වන මාස එකොළහ තුළ දී, ප්‍රධාන වශයෙන් පොල් ආශ්‍රිත නිෂ්පාදිත, ස්වභාවික රබර් සහ මුහුදු ආහාර අපනයන ආදායම පහළ යෑම හේතුවෙන් කෘෂිකාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සුළු වශයෙන් පහළ ගියේය. මීට ප්‍රතිවිරුද්ධව, මෙම කාලපරිච්ඡේදය තුළ තේ, කුළුබඩු සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන ආදායම් ඉහළ යෑමක් සිදුවිය.

# කාර්මික අපනයන


### කාර්මික අපනයන ආදායම





### කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන. - නොවැ.)





### නැව් හා ගුවන් යානා ඉන්ධනවල අපනයන මිල ගණන්





2023 වසරේ නොවැම්බර් මාසයෙන් අවසාන වන මාස එකොළහ තුළ දී ප්‍රධාන වශයෙන් ඇඟලුම් අපනයන ආදායම පහළ යෑම හේතුවෙන් කාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පහළ යෑමක් වාර්තා කළේය. තව ද, රබර් නිෂ්පාදිත, බනිජතෙල් නිෂ්පාදිත, රසායනික නිෂ්පාදිත, දැව සහ කඩදාසි නිෂ්පාදිත අපනයන ආදායමෙහි කැපී පෙනෙන පහළ යෑම් දක්නට ලැබුණි. කෙසේ වුවත්, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ සහ ප්‍රවාහන උපකරණ අපනයන ආදායම ඉහළ ගියේය.

# ආනයන ක්‍රියාකාරිත්වය

### ආනයන ක්‍රියාකාරිත්වය - (ජන. - නොවැ.)





### ආනයන පරිමා හා මිල දර්ශකය - (ජන. - නොවැ.)





පාරිභෝගික භාණ්ඩ ආනයන වියදමෙහි ඉහළ යෑමක් දක්නට ලැබුන ද, අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයන කාණ්ඩවල ආනයන වියදම පහළ යෑම හේතුවෙන් 2023 වසරේ නොවැම්බර් මාසයෙන් අවසාන වන මාස එකොළහ තුළ දී, වෙළඳ භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පහළ ගියේය. මේ අතර, සලකා බලන කාලය තුළ දී ආනයන පරිමා දර්ශකය සියයට 1.9කින් ඉහළ ගිය අතර, ආනයන මිල දර්ශකය සියයට 10.8කින් පහළ ගියේය.

## පාරිභෝගික භාණ්ඩ ආනයන


### පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම





### පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




### පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය (ජන. - නොවැ.)





### සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ ආනයන මිල ගණන් වල සාමාන්‍ය





ප්‍රධාන වශයෙන් බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත ඇතුළු ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් 2023 වසරේ නොවැම්බර් මාසයෙන් අවසාන වන මාස එකොළහ තුළ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගියේය. සලකා බලන කාලපරිච්ඡේදය තුළ ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත (සහල්), රෙදිපිළි හා උපාංග සහ ගෘහ උපකරණ ආනයන වියදම පහළ ගිය ද, සීනි සහ මේද හා තෙල් වර්ග ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් ආහාර හා පාන වර්ග ආනයන වියදම ද ඉහළ ගියේය.

## අන්තර් භාණ්ඩ ආනයන


### අන්තර් භාණ්ඩ ආනයන වියදම





### අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය
(ජන. - නොවැ.)




බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන්
(මාසික සාමාන්‍ය අගයන්)





* 2022 වසරේ මාර්තු, අප්‍රේල්, ජූනි, ජූලි, ඔක්තෝබර් මාසවල සහ 2023 වසරේ පෙබරවාරි සහ සැප්තැම්බර් මාස වල දී බොරතෙල් ආනයනය කර නැත.


මූලික වශයෙන්, රෙදිපිළි හා රෙදිපිළි උපාංග, ඉන්ධන, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ රසායනික නිෂ්පාදිත ආනයන වියදම පහළ යෑම හේතුවෙන්, 2023 වසරේ නොවැම්බර් මාසයෙන් අවසාන වන මාස එකොළහ තුළ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පහළ ගියේය. පිරිපහදු කළ ඛනිජතෙල් ආනයන අඩු වීම ඉන්ධන ආනයන වියදම පහළ යෑමට හේතු විය. මීට ප්‍රතිවිරුද්ධව, සලකා බලන කාලපරිච්ඡේදය තුළ තිරිඟු, දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග, පොහොර සහ කෘෂිකාර්මික යෙදවුම් ආනයන වියදම ඉහළ ගියේය.

## ආයෝජන භාණ්ඩ ආනයන


ආයෝජන භාණ්ඩ ආනයන වියදම




ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය
(ජන. - නොවැ.)




ගොඩනැගිලි ද්‍රව්‍ය, යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ ප්‍රවාහන උපකරණ යන සියලු ප්‍රධාන ආයෝජන භාණ්ඩ කාණ්ඩවල ආනයන වියදම පහළ යෑම හේතුවෙන්, 2023 වසරේ නොවැම්බර් මාසයෙන් අවසාන වන මාස එකොළහ තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම පහළ ගියේය.

# විදේශීය වෙළඳාම - සාරාංශය (අ)

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | නොවැ. 2022 | නොවැ. 2023 | වෙනස (%) | ජන. -නොවැ. 2022 | ජන. -නොවැ. 2023 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **199.3** | **214.8** | **7.8** | **2,364.6** | **2,359.9** | **-0.2** |
| එයින් | තේ | 105.7 | 112.8 | 6.8 | 1,151.5 | 1,198.8 | 4.1 |
| | පොල් | 23.6 | 28.7 | 21.4 | 375.5 | 313.6 | -16.5 |
| | කුළුබඩු | 27.0 | 30.9 | 14.6 | 337.4 | 361.6 | 7.2 |
| | මුහුදු ආහාර | 22.8 | 25.2 | 10.5 | 247.7 | 238.4 | -3.7 |
| **කාර්මික අපනයන** | | **792.0** | **765.4** | **-3.4** | **9,624.4** | **8,486.8** | **-11.8** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 449.8 | 396.2 | -11.9 | 5,470.5 | 4,439.0 | -18.9 |
| | රබර් නිෂ්පාදිත | 67.7 | 77.2 | 14.0 | 905.8 | 824.1 | -9.0 |
| | ඛනිජ තෙල් නිෂ්පාදිත | 40.9 | 55.2 | 34.8 | 518.6 | 478.3 | -7.8 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 38.4 | 50.3 | 30.9 | 482.8 | 495.0 | 2.5 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 48.6 | 42.6 | -12.4 | 530.4 | 555.1 | 4.7 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 36.2 | 35.9 | -0.8 | 415.3 | 475.5 | 14.5 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 6.5 | 5.8 | -11.1 | 78.4 | 66.4 | -15.2 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **4.0** | **18.8** | **366.4** | **49.8** | **62.2** | **24.8** |
| **මුළු අපනයන** | | **995.3** | **999.0** | **0.4** | **12,038.8** | **10,908.9** | **-9.4** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | නොවැ. 2022 | නොවැ. 2023 | වෙනස (%) | ජන. -නොවැ. 2022 | ජන. -නොවැ. 2023 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **222.7** | **265.2** | **19.1** | **2,571.5** | **2,771.2** | **7.8** |
| **ආහාර හා පාන වර්ග** | | 131.0 | 133.2 | 1.7 | 1,478.0 | 1,541.0 | 4.3 |
| එයින් | එළවළු (ආ) | 23.4 | 29.3 | 25.4 | 297.2 | 326.5 | 9.9 |
| | සහල් | 10.7 | 1.2 | -88.6 | 284.1 | 16.1 | -94.4 |
| **වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ** | | 91.7 | 132.0 | 43.9 | 1,093.5 | 1,230.1 | 12.5 |
| එයින් | බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 41.2 | 56.6 | 37.6 | 475.6 | 620.3 | 30.4 |
| **අන්තර් භාණ්ඩ** | | **1,012.4** | **867.8** | **-14.3** | **11,454.9** | **10,058.2** | **-12.2** |
| එයින් | ඉන්ධන | 422.4 | 316.9 | -25.0 | 4,513.2 | 4,288.5 | -5.0 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 226.5 | 203.2 | -10.3 | 2,864.3 | 2,188.0 | -23.6 |
| | පොහොර | 37.0 | 25.9 | -30.1 | 160.2 | 200.5 | 25.2 |
| | තිරිඟු හා ඉරිඟු | 52.3 | 21.4 | -59.0 | 267.3 | 318.3 | 19.1 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **209.5** | **255.7** | **22.1** | **2,839.0** | **2,493.2** | **-12.2** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 141.1 | 168.4 | 19.4 | 1,839.1 | 1,692.8 | -8.0 |
| **මුළු ආනයන** | | **1,444.6** | **1,388.7** | **-3.9** | **16,865.5** | **15,322.6** | **-9.1** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | නොවැ. 2022 | නොවැ. 2023 | වෙනස (%) | ජන. -නොවැ. 2022 | ජන. -නොවැ. 2023 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | -449.2 | -389.7 | | -4,826.6 | -4,413.6 | |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (ඇ)

| කාණ්ඩය | | නොවැ. 2022 | නොවැ. 2023 | වෙනස (%) | ජන. -නොවැ. 2022 | ජන. -නොවැ. 2023 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 138.5 | 139.0 | 0.4 | 152.3 | 138.0 | -9.4 |
| | පරිමා දර්ශකය | 141.1 | 155.8 | 10.4 | 162.3 | 166.0 | 2.3 |
| | මිල දර්ශකය | 98.2 | 89.3 | -9.1 | 93.8 | 83.1 | -11.4 |
| **ආනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 129.3 | 124.3 | -3.9 | 137.2 | 124.7 | -9.1 |
| | පරිමා දර්ශකය | 117.7 | 127.6 | 8.4 | 126.4 | 128.7 | 1.9 |
| | මිල දර්ශකය | 109.8 | 97.4 | -11.3 | 108.6 | 96.9 | -10.8 |
| **වෙළඳ මිල අනුපාතය** | | 89.4 | 91.6 | 2.5 | 86.4 | 85.8 | -0.7 |

(අ) තාවකාලික

(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

(ඇ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද